# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් තිමෝතියස් තුමන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**1 තිමෝති 6: 2-12**

"දෙවියන් වහන්සේ ට කැපවූවකු වන ඔබ ධර්මිෂ්ඨ වන්න."

දයාවන්ත කිතුණු ස්වාමිවරුන් ඇති දාසයෝ, ඔවුන් දෙගොල්ල ම සහෝදරයන් වන නිසා, තම ස්වාමිවරුන් සුළු කොට නොසැලකිය යුත්තෝ ය. එසේ නොකර, තමන්ගේ වැඩවලින් ප්‍රයෝජන ලබන ස්වාමිවරුන්ට ඔවුන් වඩාත් හොඳින් සේවය කළ යුතුය. කවර හෙයින් ද? ඔවුන් ද තමන් ප්‍රේම කරන කිතුණුවන් වන බැවිනි. ඔබේ ඉගැන්වීම් වල දී මේ කාරණා තරයේ කියන්න.

යමෙක් වෙනස් ධර්මයක් උගන්වමින්, අපගේ වැඩදායක ධර්මය වන, අපේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වචනවලටත්, විශ්වාසවන්ත ඉගැන්වීමටත් විරුද්ධ ව යන්නේ නම්, ඔහු අඥානයෙකි. උඩගුකමින් පිරුණ තැනැත්තෙකි. ඔහු සැම දේ ගැන සැක කිරීමෙන් ද, වචන ගැන ප්‍රශ්න කිරීමෙන් ද උමතු වූවෙකි. එයින් ඊර්ෂ්‍යාව ද කලහ ද අපහාස ය ද කුට අවිශ්වාසය ද මිථ්‍යා අදහස් ඇති, සත්‍ය නොදන්න, ආගම ලාභයට මඟකැ සිතන, මිනිසුන්ගේ කෙළවරක් නැති වාද විවාද ද උපදින්නේ ය. ඇත්තෙන් ආගම ලාභයට මඟක් වන්නේ ඇති දෙයින් සතුටු වන්නාට ය. අප මෙලොවට පැමිණියේ හිස් අතිනි. හිස් අතින් එය හැර යන්නට ද ඕනෑ ය. කන්නට අඳින්නට ඇත්නම් අපට සෑහෙයි. ධනවත් වීමට ආශා වන්නෝ පරීක්ෂාවලටත්, උගුල්වලටත්, අසු වන්නෝ ය. නාස්තියටත්, විනාශයටත් පමුණුවන, නොයෙකුත්

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# සිකුරාදා

මෝඩ නිෂ්ඵල තෘෂ්ණාවන්ට ඔව්හු වසඟ වන්නෝ ය. මුදල් තණ්හාව සෑම නපුරට මුල ය. සමහරු මුදලට ආලය වී ඇදහිල්ලෙන් වැටී, තමන්ට ම බොහෝ දරුණු ලෙස තුවාල කරගත්හ.

එහෙත් දෙවියන් වහන්සේට කැපවූවකු වන ඔබ, මේ දේවලින් වැළකී සිටිය යුතුය. ධර්මිෂ්ඨකමට ද භක්තිවන්තකමට ද ඇදහිල්ලට ද ප්‍රේමයට ද ඉවසිලිවන්තකමට ද ශාන්තදාන්තකමට ද අවධානය යොමු කරන්න. ඇදහිල්ල නමැති මහා ධාවනය වීර්යයෙන් දුවන්න. සදාතන ජීවනය ඇති කරගන්න. ඔහු එයට කැඳවනු ලැබුවේ සාක්ෂිකාරයන් කීප දෙනකු ඉදිරියෙහි ඔබේ ඇදහීම නිර්භීත ලෙස සහතික කොට ප්‍රකාශ කළ විටය.

දේව වචනය මෙසේ ය.

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# සිකුරාදා

## පිළිතුරු ගීය

ගීතාවලිය 49 : 5-9, 16-19

පිළිතුර: බැගෑ සිතැත්තෝ භාග්‍යවන්තයෝ ය.
ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.

ගීය:

අන්තරා කාලවල දී, නපුරු සතුරන් මා සිසාරා සිටින විට, සිය ධන සම්පත් කෙරේ විශ්වාසය තැබූ, සිය වස්තු සම්භාරය නිසා අහංකාර වූ අය මා අවටින් සිටින විට, මම කිසිසේත් බිය නොවන්නෙමි.

තම විමුක්තිය තමාට ම සාදා ගත නොහැකි ය. ජීවිතය සඳහා මිදීමේ මිළය දෙවිඳුන්ට ගෙවීමට ඔහුට නුපුළුවන.
මිනිසෙකුගේ ජීවිතය සඳහා ගෙවිය යුතු මිදීමේ මිළය ඉතා විශාල ය.
මිනීවළට යෑමෙන් වැළකෙන පිණිසත්, සදා ජීවත් වීමට වරයක් ලබන පිණිසත්, තමා විසින් ගෙවනු ලැබිය හැකි මිලය කිසිසේත් නොසෑහේ.

යමෙකු පොහොසත් වන විට, ඔබගේ යස ඉසුරු වැඩි වන විට බිය නොවන්න.
අපවත් වන විට ඔහු ඉන් කිසිවක් ගෙන යන්නේ නැත. ඔහුගේ යස ඉසුරු ඔහු කැටුව මිනීවළට නොයනු ඇත.

## සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
## සිකුරාදා

මිනිසෙක් සිය ජීවිත කාලයේ දී තෘප්තියට පත් වී සිටියත්, තමන් ගැන පුරසාරම් දෙඩුවත්, ඔහුගේ දියුණුව ප්‍රශංසාවට ලක් වුවත්, ඔහු තම මුතුන් මිත්තන් මෙන් මිය යන්නේ ය. එහි සදහට ම අඳුර පවත්නේ ය.

### සුබපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ඔබේ සිත් දැඩිකර නොගන්න.
සමිඳුන් වදනට සවන් දෙන්න.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත් පොළොවටත් ස්වාමීන් වන පියාණන් වහන්ස,
දේව රාජ්‍යය පිළිබඳ අභිරහස් හුදෙක් බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබවහන්සේට ස්තුති වේවා!
ආලේලූයා!

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# සිකුරාදා

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 8: 1 – 3

"ස්ත්‍රීහු සිය සම්පතින් උන්වහන්සේට උපස්ථාන කළහ."

ජේසුස් ස්වාමීන් වහන්සේ ධර්ම දේශනා කරමින් ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ සුබ අස්න ප්‍රකාශ කරමින් ද නගර සහ ගම්වල සැරිසැරූ සේක. උන්වහන්සේ සමඟ ගෝලයෝ දොළොස් දෙනා ද අශුද්ධාත්ම කෙරෙන් හා ලෙඩ රෝගවලින් සුවය ලත් සමහර ස්ත්‍රීහු ද තමන් කෙරෙන් යකුන් හත් දෙනෙකු දුරු කරනු ලැබූ මග්දලේනා නම් ලත් මරියා ද හෙරෝද්ගේ භාණ්ඩාගාරික වන කූසාගේ භාර්යාව වන ජෝවන්නා ද සූසානා ද සිය සම්පතින් උන්වහන්සේට උපස්ථාන කළ බවත් බොහෝ ස්ත්‍රීහු ද සිටියහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.